GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

27/08/2013

**මාධ්‍ය නිවේදනයයි**

**රජයේ වෛද්‍ය නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 සඳහා ඇතුලත් නොකිරීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 22/99 මගින් ජේෂ්ඨ මට්ටමේ සිටින සියලුම රාජ්‍ය නිලධාරීන් සඳහා රජය මගින් ප්‍රවාහන පහසුකම් හෝ ඒ වෙනුවට දීමනාවක් ලබා දීම සිදු කරනු ලබයි. නමුත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් කාණ්ඩයක් වන වෛද්‍ය නිලධාරීන් මෙම චක්‍රලේඛය මගින් ආවරණය වී නොමැත.

රාජකාරියේ ස්වභාවය සැලකිල්ලට ගතහොත්, ප්‍රවාහන පහසුකම් වැඩියෙන්ම අවශ්‍ය කණ්ඩායම වෛද්‍ය නිලධාරීන්ය. මන්දයත් පැය 24 පුරාම ඔවුන් රෝගී සත්කාර සේවා සඳහා පොරොත්තු සේවයේ සිටිය යුතු බැවිනි. රෝගියෙකු පරික්ෂා කිරීමට රෝහලෙන් කැඳවීමක් ලැබුණු වහාම කෙටි කාලයක් ඇතුලත රෝගියා පරික්ෂා කල යුතු වුවත්, රෝහල් භූමිය තුල පදිංචි වී සිටීමට නිල නිවාස ලැබී ඇත්තේ ඉතාමත් සුළු ප්‍රතිශතයකට පමණි. එබැවින් වෛද්‍ය නිලධාරීන්ට අධික මුදලක් වැය කොට රෝහල ආසන්නයේ නිවාස කුලියට ගැනීමට සිදු වී ඇති අතර, තමන්ගේ වාහන යොදා ගනිමින් කැඳවීමක් ලත් විට කඩිනමින් සේවා ස්ථානයට වාර්තා කිරීමටද සිදුවී ඇත.

මේ සියලු කාරණා සැලකිල්ලට ගෙන වෛද්‍ය නිලධාරීන්ට දැනට විවේක කාල බාධා, පොරොත්තු රැඳී සිටීම හා ප්‍රවාහන යනුවෙන් (DAT) දීමනාවන් ගෙවනු ලබයි. මුදල් අමාත්‍යාංශය 2008 දි තක්සේරු කල පරිදි මෙය රු. 29,000/= ක් විය යුතුය. එම තක්සේරුව සිදු කර වසර 05ක් ගතවී ඇතත් තවමත් එය රු. 25,000/= ඉක්මවා නැත.

නමුත් රාජ්‍ය සේවයේ සමාන්තර නිලධාරීන්ට වාහනයක්, ඉන්ධන, නඩත්තුව හා රියදුරෙකු රජය මගින් ලබා දී ඇත. නැතහොත් තමන්ගේ වාහනය රාජකාරී කටයුතු සඳහා යොදා ගන්නේ නම් රු 52,000/= ක දීමනාවක් රජය මගින් ලබා දේ.

ඒ අනුව සංසන්දනාත්මකව බැලූ විට වෛද්‍ය නිලධාරීන්ට ලැබිය යුතු දීමනාවෙන් අඩක්වත් තවම ලැබෙන්නේ නැත. මෙවන් වාතාවරණයක් තුල ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම අපහසු වීම නිසා රෝගී සත්කාර සේවාවේ ගුණාත්මකභාවය කෙරෙහි මෙය සෘජුවම බලපා ඇත.

එබැවින් එලබෙන අයවැයෙන් වෛද්‍යවරුන්ගේ ප්‍රවාහන දීමනාව (DAT) දීමනාව රු.52,000/= දක්වා වැඩි කරන ලෙස අපි රජයට යෝජනා කර සිටිමු.

ස්තූතියි,

FN

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න - 0714800942
වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516